Department of Education,Sabaragamuwa Province/ Weekly School

# අපටත් වැසිකිලියක්

01. හැඳින්වීම කියවා කේ.ජයතිලක මහතාගේ සාහිත්‍ය නිර්මාණ ඇසුරින් පහත වගුව පුරවන්න.

| කෙටිකතා | නවකතා | ළමා කෘති | නාට්‍ය | චරිතාපදාන |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

02. හිස්තැන් පුරවන්න.

I. කේ.ජයතිලක මහතා .......................... උපත ලැබුවේ ය.

II. ඔහුගේ මුල් ම කෙටිකතා සංග්‍රහය වන්නේ ................................ නම් කෘතිය යි.

III. අපටත් වැසිකිළියක් කෙටිකතාව උපුටා ගත්තේ.......................... නම් කෘතියෙනි.

IV. මෙතුමා ලේඛකයෙකු එක් වරක් පමණක් පිදුම් ලබන ...................................... සම්මානයෙන් පිදුම් ලැබුවේ ය.

V. ඔහුට ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් පිරිනැමෙන ........................................ සම්මානය ද ලැබුණි.

03. මෙම කෙටිකතාව කියවා එහි එන අවස්ථා සහ සිදුවීම් පෙළ ගස්වන්න.

04. පහත චරිත ගැන කෙටි විස්තර ලියන්න.

I. මම (කථකයා)

II. අක්කා

III. තාත්තා

05. වැසිකිළි භාවිතය පිළිබඳව එදා ගැමියන් තුළ තිබූ ආකල්ප හා මතවාද හෙළි වන අවස්ථාවලට උදාහරණ හැකිතාක් උපුටා දක්වන්න.

06. මෙම කෙටිකතාවේ සාර්ථකත්වයට පහත දැක්වෙන භාෂා විශේෂතා හේතු වී ඇත. ඒවාට හැකිතාක් උදාහරණ උපුටා දක්වන්න.

I. ගැමි වහර යොදා ගැනීම

II. ගැමි උපමා යොදා ගැනීම

III. සාම්ප්‍රදායික යෙදුම් භාවිතය( ඉඟි වැකි, යුගල පද, පිරුළු)